<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

ඥානේන්ද්‍ර ශානි අබේසේකර,
අංක L /1/1,
ඇල්විටිගල මහල් නිවාස,
කොළඹ 08.

<u>පැමිණිලිකරු</u>

නඩු අංකය :
ස්වභාවය : මුදල්
කාර්යපටිපාටිය : සාමාන්‍ය,
වටිනාකම : රු.500,000,000/-

**-එදිරිව-**

1. චමුදිත සමරවික්‍රම,
   අංක 45,
   කේම්බ්‍රිජ් කෝට්,
   වැවල,
   පිළියන්දල.

2. ඒෂියා බ්‍රෝඩ්කාස්ටින් කෝපරේෂන් (පුද්ගලික) සමාගම,
   35 වන මහල,
   නැගෙනහිර කුළුණ,
   ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
   කොළඹ 01.

<u>විත්තිකරුවන්</u>

වර්ෂ 2022 ක් වූ සැප්තැම්බර් මස 26 වන දින දී ය.

ඉහත නම් සඳහන් පැමිණිලිකරු සිය ලේඛනගත නීතිඥ නෙලුෂා මල්ෂානි ධීරසේකර මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරනු ලබන **පැමිණිල්ල** මගින් මෙසේ ප්‍රකාශ කර සිටියි.

1. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ;
   (අ) පැමිණිලිකරු 1986 වර්ෂයේදී උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලිස් සේවයට එක්වීමෙන් අනතුරුව වර්ෂ 1986 ජූලි 01 වන දින හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකාය වෙත සම්බන්ධ වූ බවත් ;

(ආ) අනතුරුව පැමිණිලිකරු ශ්‍රී ලංකා පොලිස් සේවයේ නොයෙකුත් ඉහල තනතුරු දරන ලද බවත් ;

(ඇ) පැමිණිලිකරු වර්ෂ 2013 අගෝස්තු මස 25 වන දින හෝ ඊට ආසන්න දිනකදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු වශයෙන් පත් කරන ලද බවත් ;

(ඈ) පැමිණිලිකරු 1999 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා ද නැවත 2009 වර්ෂයේ සිට 2019 දක්වා ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කටයුතු කරන ලද බවත් ;

(ඉ) පැමිණිලිකරු විසින් සිය රාජකාරී දිවිය තුළදී ශ්‍රී ලංකාව කැළඹූ අපරාධ ගණනාවක් විසඳීමට සක්‍රියව විමර්ශන මෙහෙයවා ඇති බවත් ; ඒ අතර;

i. වර්ෂ 1999 දී හිටපු ජනාධිපතිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය ඝාතනය කිරීමට තැත් කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

ii. වර්ෂ 2001 දී එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානය විසින් කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල වෙත ප්‍රහාර එල්ල කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

iii. වර්ෂ 2001 වසරේ දී සහකාර රේගු අධිකාරී සුජිත් ප්‍රසන්න පෙරේරා ඝාතනය පිළිබඳ විමර්ශනය;

iv. වර්ෂ 2005 දී රෝයල් පාර්ක් නිවාස සංකීර්ණයේ සිදුවූ ඉවෝන් ජොන්සන් ඝාතනය පිළිබඳ විමර්ශනය;

v. වර්ෂ 2006 දී එවකට හිටපු ආරක්ෂක ලේකම් සහ හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා ඝාතනයට තැත් කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

vi. වර්ෂ 2008 දී මාධ්‍යවේදී කීත් නොයාර් මහතා පැහැරගැනීම සහ වධහිංසා පැමිණවීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

vii. වර්ෂ 2008/2009 කාල වකවානුවේ දී නාවුක බුද්ධි සාමාජිකයින් විසින් තරුණයින් 11 දෙනෙකු පැහැරගෙන ගොස් ඔවුන් ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

viii. වර්ෂ 2009 දී මාධ්‍යවේදී පෝද්දල ජයන්ත මහතා පැහැරගැනීම සහ පහරදීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

ix. වර්ෂ 2009 දී සිදුවූ "අඟුලාන පොලිස් ස්ථානයට අනුයුක්ත නිලධාරීන් විසින් සිදු කරන ලද ද්විත්ව මිනීමැරුම" සිද්ධිය පිළිබඳ විමර්ශනය;

x. වර්ෂ 2009 දී සිදුවූ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය පිළිබඳ විමර්ශනය;

xi. වර්ෂ 2010 දී සිදුවූ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

xii. වර්ෂ 2012 දී සිදුවූ වසීම් තාජුදීන් ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

xiii. වර්ෂ 2013 දී ව්‍යාපාරික මොහොමඩ් ෂියාම් මහතා එවකට නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන් කටයුතු කළ අයෙකුගේ මෙහෙයවීම මත, ඔහු යටතේ සේවය කළ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් පැහැරගෙන ගොස් ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

xiv. වර්ෂ 2013 දී සිදු වූ රතුපස්වල ගම්වාසීන්ට වෙඩිතබා ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය;

xv. වර්ෂ 2015/2016 කාල වකවානුවේ දී සිදු වූ මහබැංකු බැඳුම්කර නිකුත් කිරීමේදී සිදු වී ඇති වංචාව පිළිබඳ විමර්ශනය;

xvi. එවකට හිටපු මන්ත්‍රී දුමින්ද සිල්වා මහතාට වර්ෂ 2016 දී ත්‍රිපුද්ගල මහාධිකරණයක් විසින් මරණ දඬුවම ලබා දීමට මුල් වූ වර්ෂ 2011 දී භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතා ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය, ආදී වූ විමර්ශන වන බවත්,

(ඊ) පැමිණිලිකරු වර්ෂ 2021 ජුනි මස 30 වන දින හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී ලංකා පොලිස් සේවයෙන් විශ්‍රාම ගිය බවත්,

(උ) පැමිණිලිකරුගේ වසර 35 ක් පමණ කාලයක් පුරාවට දිවෙන ඉහත කී වෘත්තීය ජීවිතය තුල පැමිණිලිකරු  නොකැළැල් කීර්තිනාමයක් දිනාගෙන සිටි බවත්,

(ඌ) කාර්යක්ෂම, අවංක හා වෘත්තීය ආචාරධර්ම රකිමින් සිය රාජකාරි කටයුතු නිසි පරිදි සිදු කරන වෘත්තිකයකු වශයෙන් හා රාජ්‍ය නිලධාරියකු වශයෙන් ද, ආචාරශීලි හා නීතියට ගරු කරන පුරවැසියකු වශයෙන් ද ගෞරවනීය විනිසුරුවරුන්, ජාත්‍යන්තර අපරාධ පොලිස් සංවිධානය (INTERPOL), අධිකරණ සහ රාජ්‍ය සේවයේ අනෙකුත් ඉහළ පෙළේ සාමාජිකයින්, පොදු මහජනතාව අතර මෙන්ම සමස්ත නීති ක්ෂේත්‍රය තුලත් කිර්තිනාමයක් දිනාගෙන ඇති බවත් ය.

පැමිණිලිකරුගේ අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තිමය පළපුරුද්ද පිළිබඳ ලුහුඩු විස්තරයක සත්‍ය පිටපතක් **'පැ1'** වශයෙන් ලකුණු කොට මීට අමුණා ඉදිරිපත් කරන අතර එය මෙම පැමිණිල්ලේම කොටසක් වශයෙන් භාරගන්නා ලෙස අයැද සිටිනු ලැබේ.

2. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඉහත නම් සඳහන් 1 වන විත්තිකරු මාධ්‍යවේදියෙකු සහ රූපවාහිනී වැඩසටහන් මෙහෙයවන්නෙකු වශයෙන් කටයුතු කරන බවයි.

3. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඉහත නම් සඳහන් 2 වන විත්තිකරුඃ

   අ) ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය යටතේ නිසි පරිදි සංස්ථාපනය කරන ලද ස්වකීය සංස්ථාපිත නාමය යටතේ නඩු පැවරිය හැකි හා පවරනු ලැබිය හැකි, නීතිය ඉදිරියේ අඛණ්ඩ පැවැත්මක් ඇති සමාගමක් වන අතර එහි ලියාපදිංචි කාර්යාලය මෙම පැමිණිල්ලේ ශීර්ෂයේ සඳහන් ලිපිනයේ පිහිටා ඇති බවත්;

   ආ) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රූපවාහිනී නාලිකාවක් වන "හිරු ටීවී" රූපවාහිනී නාලිකාවේ අයිතිකරු සහ/හෝ ලියාපදිංචි බලපත්‍රලාභියා බවත් "හිරු ටීවී" රූපවාහිනී නාලිකාව 2 වන විත්තිකරුගේ පාලනය සහ/හෝ අධීක්ෂණය සහ/හෝ සම්පූර්ණ අනුමැතිය සහ/හෝ කැමැත්ත අනුව වැඩසටහන් විකාශය කරන රූපවාහිනී නාලිකාවක් බවත් ය.

4. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, 2 වන විත්තිකරුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ ද මෙහි මින් මතු සවිස්තරව දක්වන නඩු නිමිති උපචය වන ලද්දේ ද මෙම ගරු අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ බැවින් මෙම නඩුව අසා තීන්දු කිරීමට මෙම අධිකරණයට අධිකරණ බලය ඇති බවයි.

5. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 2 වන විත්තිකාර සමාගම "පත්තරේ විස්තරේ" නම් රූපවාහිනී වැඩසටහන සතියේ සෑම දිනකම උදෑසන දිවයින පුරාම සජීවීව විකාශය/ප්‍රකාශනය කරන අතර අනතුරුව එය https://www.youtube.com/c/HiruNewsOfficial/featured යන "Hiru News" You Tube චැනලය ඔස්සේ සහ https://www.facebook.com/hirunews/ යන "Hiru News" Facebook සමාජ මාධ්‍ය පිටුව ඔස්සේ ද දේශීය හා විදේශීය රටවල සිටින ශ්‍රී ලාංකිකයන් අතර විකාශය කරන බවත්, ඒ අනුව මෙම "පත්තරේ විස්තරේ" නම් රූපවාහිනී වැඩසටහන දේශීයව මෙන්ම විදේශීය රටවල ජීවත්වන ශ්‍රී ලාංකීය ජනතාව අතර ඉතා ප්‍රචලිත නාලිකාවක් බවත්ය.

6. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ වර්ෂ 2021 ඔක්තෝම්බර් මස 19 වන දින 2 වන විත්තිකරු විසින් විකාශය/ප්‍රකාශනය කරන ලද කරන ලද ඉහත කී "පත්තරේ විස්තරේ"

නම් රූපවාහිනී වැඩසටහනෙහි මාධ්‍යවේදියා ලෙස 1 වන විත්තිකරු කටයුතු කරන ලද බවයි.

7. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 2 වන විත්තිකරු විසින් 2021 ඔක්තෝම්බර් මස 19 වන දින විකාශය කරන ලද "පත්තරේ විස්තරේ" නම් වැඩසටහනේ දී ලක්මන ආරච්චිලාගේ සුගත් කුමාර ලක්මන (මින් මතුවට සුගත් කුමාර ලක්මන ලෙස හැඳින්වෙන) යන අයෙකු විසින් පැමිණිලිකරු පිළිබඳව කරන ලද ප්‍රකාශයක් ඇතුලත් වන පහත සඳහන් ප්‍රකාශය 1 වන විත්තිකරු සහ/හෝ 2 වන විත්තිකරු විසින් සජීවීව විකාශය/ප්‍රකාශනය (Broadcast/Publication) කරන ලද බවයි. එනම්;

චමුදිත සමරවික්‍රම - ශානි ඇතුළු තිදෙනෙකුට එරෙහි නඩුව කැඳවයි, මේ ගම්පහ ටෝනි කරුණානායකගේ වාර්තාව. අසත්‍ය සාක්ෂි නිර්මාණය කර අධිකරණය නොමග හැරීම ඇතුළු තවත් චෝදනා සම්බන්ධයෙන් ඇප මත සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේතුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර ඇතුළු සැකකරුවන් තිදෙනාට විරුද්ධව ඇති නඩුව ඊයේ ගම්පහ ප්‍රධාන මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා හමුවේ කැඳවුනා. ඒ කැඳවූ අවස්ථාවෙන් පසුව ඇතිවූ තත්වය දෙස දැන් අවධානය යොමු කරමු.

නිවේදකයකු - අසත්‍ය සාක්ෂි නිර්මාණය කර අධිකරණය නොමග හැරීම ඇතුළු චෝදනා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකරට එරෙහිව ගොනු කර ඇති නඩුව කැඳවුයේ ගම්පහ ප්‍රධාන මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා ඉදිරියේයි. මේ වන විට ඇප මත මුදාහැර සිටින ශානි අබේසේකර නඩු කටයුතු අවසන් වීමෙන් පසු පිටතට පැමිණි අවස්ථාවේදී අධිකරණ සංකීර්ණය ඉදිරිපිට සිටි පුද්ගලයකුගෙන් ඔහුට දැඩි විරෝධයක් එල්ල වුනා.

සුගත් කුමාර ලක්මන - " ඔබතුමාට මාව මතක නැතුව ඇති නේද? මම තමයි මැලේසියාවේ හිටපු සුගත් ලක්මන , ඔයා මාව රට ඉන්දැද්දී ගෙනල්ලා ඉවරවෙලා රජයේ මුදල් අවභාවිතා කරලා තමයි මාව ගෙනාවේ. එතකොට ගෙනල්ලත් මට ඉඳන් කිව්වෙ මොකද්ද මාව දවස් දාහතරක් රිමාන්ඩ් කරගෙන හිටියා. එතකොට මාව ගෙනල්ලා ඉඳන් කිව්වා මහින්ද මහත්තයට විරුද්ධව කතා කරන්න කියලා, මෙහෙමයි කියලා. මේ තියෙන්නෙ මාව උසාවියෙන් නිදොස්කොට නිදහස් කරද්දීත්, මෙයා වීරගුල පොලීසියට මැසේජ් එකක් ගැහුවා මාව ත්‍රස්ත විමර්ශන අංශයට ගේන්න කියලා. එහෙව් තියෙද්දී අද මම නිදහසේ ඉන්නවා, හැබැයි අද ඔබතුමා උසාවි ගානෙ රිංගනවා. ඕක තමයි මහත්තයෝ කියන්නේ දිට්ඨධම්මවේදනීය කර්මය කියලා, තේරුනාද? ඔබතුමා අද ඔහොම එළියේ නෙවෙයි ඉන්න ඕන, ඔබතුමා අද ඉන්න ඕන, එල්ලුම්ගස් යන්න ඕන. අන්න මාව සී.අයි.ඩී ඒකට ගෙනාපු වෙලාවෙත් මට ඉඳන් කිව්ව රාජපක්ෂලාට කඬේ යනවයි

කියලා. නමුත් අද මම එළියේ ඉන්නවා. මාව නිදොස්කොට නිදහස් කරල තියෙද්දී තමයි මේවා ඔක්කොම කරේ. මේ තියෙන්නේ මේ.... උසාවියෙන් නිදොස්කොට නිදහස් කරලා. මේ සියලුම ඩොකිව්මන්ට්ස් මං ගාව තියෙනවා. ජරා විදියට හැසිරෙන්න එපා. නඩුකාර හාමුදුරුවන්ට කතා කර කර, නඩුකාරවරුන්ට කතා කර කර, දැන් අද කොහොමද තත්වෙ. මට කියන්න එච්චරයි දැන් ඉතින් කටත් පුකත් වහගෙන යනව."

සුගත් කුමාර ලක්මන - යහපාලන ආණ්ඩු රජය තිබ්ච්ච වෙලාවෙදි මම ජාතික ගීය දෙමළෙන් ගායනා කරනවට විරුද්ධ උනා. ගෝල්ෆේස් පිටියේ තිබ්බේ මේ නිදහස් උත්සවේ දවසෙ. එතකොට මං ඒකට මගේ හිතේ වේදනාවට යම්කිසි ප්‍රකාශයක් කරා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි, රනිල් වික්‍රමසිංහටයි මම දොස් කිව්වා.

වාර්තාකරුවෙකු - කොහේදිද කිව්වෙ ඕක.

සුගත් කුමාර ලක්මන - මම කිව්වෙ මැලෙසියාවේදී. මං මගේ ෆේස්බුක් එකේ විතරයි මං අප්ලෝඩ් කරේ. විරුද්ධ උනාට පස්සේ මෙයාල මට අධිචෝදනාපත්‍රයක් භාර කරා ජනාධිපතිව මරන්න තර්ජනය කරා. ජනාධිපතිව බලයෙන් පහ කරන්න කියලා. ඊටපස්සේ මෙයාල මට මොකද කරේ. රජයේ මුදල් අවභාවිතා කරල පිටරට ගියා. මැලේශියාවේ දවස් හතක් එයාල ඉඳලා ඉවරවෙලා එයාල ගන්න ෆන් අනංමනං ඔක්කොම අරගෙන මාව එහෙදි අත්අඩංගුවට අරගෙන. මෙයාල මාව ගෙනාවේ හොර පාස්පෝට් එකකින්. මගේ ෆේස්බුක් එකේ තියෙන ෆොටෝ එකක් අරගෙන ෆොටෝ එක පාස්පෝට් එකට තියල තමා මෙයාල මාව හොර පාස්පෝට් එකෙන් අරං අවේ. මං දන්නෑ මොන හේතුවකට එහෙම ගෙනාවද කියල. එක්කො මාව මරන්න ගෙනාවද කියල මම දන්නේ නෑ. එතකොට මම ඒවා ඔක්කොම මෙයාලට අමතක වෙලා තමා මට ඒවා ඔක්කොම රිලීස් කරේ. අහපු එකම දෙය තමයි රාජපක්ෂලට කඩේ යනව නේද? මාව එතනින් අල්ලාගෙන ඇවිල්ල දවල් 12ට විතර මට මාව කටුනායකට ගෙනාවේ. ගෙනල්ල ඉවරවෙලා කෙලින්ම සී.අයි.ඩී එකට අරං ගියාට පස්සෙ තමයි රාජපක්ෂ මේවා කරන්න කිව්වෙ, අරව කරන්න කිව්වේ කියලා මට චෝදනා කරනවා. මෙයා කියන්නේ එහෙම කියන්න. එතකොට නිදොස්කොට නිදහස් කරනවා. ඊටපස්සේ මෙහෙ ඇවිල්ලා දවස් 14ක් රිමාන්ඩ් කරා. මට ඊටපස්සේ අධිචෝදනාපත්‍ර භාරකරා. හැබැයි මේ කිසිම කෙනෙක් පැමිණිල්ලක් දාල නෑ. දැන් මං කාටහරි ගහනවනන් හරි මොනව කරනවනං දැන් එයා පැමිණිල්ලක් දාන්න ඕනනේ. ඊටපස්සේ විනිශ්චයකාරතුමා ඇහුව කවුද මේකෙ පැමිණිල්ල... පැමිණිල්ලක් නැහැ ස්වාමිනි කියල කිව්ව. යහපාලන ආණ්ඩුවෙන් තමයි මේ පැමිණිල්ල දාන්න කියල තියෙන්නෙ. එතකොට ඒකත් හරි කියන්නකෝ... දැන් මාව නිදොස්කොට නිදහස් කරා මේකෙන්. මෙයාගෙ තියෙන

බලතල කියන්නෙ නඩුකාරවරයෙක් දුන්න තීන්දුවට අභිබවා යනව ශානි අබේසේකර. එතකොට කොහොම තත්වයක්ද?

චමුදිත සමරවික්‍රම - පේනවනේ... දිග අරින්න ඕන තියෙන නීතිය හොඳට නවලා තියෙන හැඩයි ශානි අබේසේකර. ශානි අබේසේකර කරපු දේවල් ඉතින් රංජන් රාමනායකගේ හඬපට ඇතුළෙන්ම දැක්කනේ. පොලිසිය කියන්නේ ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින් රකිනවයි කියලා ධර්ම චක්‍රයත් එක්ක. හැබැයි පොලීසිය, පොලිස් දෙපාර්තමේන්තුව මේ අය කුණු කූඩෙටම දැම්මා. එක්කො පොලිසිය තමන්ගේ ප්‍රමෝෂන් එක, තමන්ගේ එක්ස්ටෙන්ෂන් එක ජනාධිපතිට ඕන විදියට, අගමැතිට ඕන විදියට, ඇමතිවරුන්ට ඕන විදියට කරන්න තියෙන බලූ වැඩ ඔක්කොම කරලා පොලිස් දෙපාර්තමේන්තුව කුණු කූඩෙටත් දාලා තමයි යනකොට ගෙදරට යන්න ගියේ. ඒ නිසා අපිට මේ කතාව කිව්වට තේරෙන්නෙ නෑ. කල්පනා කරලා බලන්න නිර්දෝෂී මනුස්සයෙක් අසත්‍ය සාක්ෂි ගොනු කරලා, ෆයිල් හදලා නිරපරාදේ හිරේ දැම්මට පස්සේ ඒ මනුස්සයට ඇතිවෙන දේ අපිට කිව්වට ඒක තේරෙන්නෙ නෑ. අපිට ඒ අත්දැකීම නෑ. ඒ නිසා පොලිසිය, පොලිස් දෙපාර්තමේන්තුවම ශානි අබේසේකරලා අමු අමුවේම දූෂණය කරා. අමු අමුවේම. මිනිස්සුන්ට සාධාරණයක් සඳහා යන්න තියෙන එකම තැන පොලීසිය විතරයි. ඒ තැන පිලිබඳ තියෙන විශ්වාසය තිබුනද දශමයක් හරි තිබුන නම් ඒකත් නැත්තටම නැති කරලා තමයි ශානි අබේසේකරලා යන්න ගියේ. ඒ නිසා මිනිස්සුන්ට රට එපා වෙලා පාස්පෝට් පෝලිමේ ඉන්න එක සාධාරණයි. ඒ නිසා මේ වගේ රටකින් පුළුවන් තරම් ඉක්මනට යන්න ඕන කියන එක මේ මිනිස්සු හිතන එකේ අන්තිම සාධාරණයි. ඒ නිසා ශානිලා කරපු කියපු දේවල් වලින් ඔය අතලොස්සක් විතරයි. ඈ..... රංජන් රාමනායකගේ හඬපට එලියට අවේ නැත්නම් ශානි තාමත් සුදු පිරුවටයක් ඇඳගත්ත මනුෂ්‍යයෙක් විතරයි. එතනින් තමයි පිරුවට ඔක්කොම ගැලවෙන්න පටන්ගත්තෙ. ඒ නිසා මේ හැමදෙයක් පිළිබඳවම එකින් එක අනාවරණය නොවුනොත් එහෙම පොලිස් දෙපාර්තමේන්තුව ගැන තිබුනා නම් අබ මල් රේණුවක හරි පුංචි හරි විශ්වාසයක් ඒකත් ශානිලා ඉවරෙටම ඉවර කරලා දාලා පොලිසියේ දොරත් වහලා තමයි ගෙදර යන්න ගියේ.

*1 වන විත්තිකරු විසින් කරන ලද, 2 වන විත්තිකරු විසින් විකාශය කරන ලද සහ/හෝ විකාශය කිරීමට සලස්වන ලද ඉහත කී ප්‍රකාශ (මෙහි මින් මතු **"ඉහත කී අපහාසාත්මක ප්‍රකාශනය"** ලෙස හඳුන්වන) 2021 ඔක්තෝම්බර් මස 19 වන දින විකාශය කරන ලද "පත්තරේ විස්තරේ" නම් වැඩසටහනේ සහ "Hiru News" නම් You Tube නාලිකාවේ <u>https://www.youtube.com/watch?v=-YQDSOidjL8</u> සබැඳිය මගින් පළ කර ඇති, **"ඉහත කී අපහාසාත්මක ප්‍රකාශනය"** ඇතුලත් DVD තැටියක් **'පැ2'** වශයෙන්ද, එහි ලිඛිත අනු*

*පිටපතක් **'පැ2(අ)'** වශයෙන්ද ලකුණු කර පැමිණිල්ලේම කොටසක් ලෙස අයදිමින් මිට අමුණා ඇත.*

8. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඉහත **'පැ2'** වශයෙන් ලකුණු කරන ලද ප්‍රකාශන වල පහත සදහන් ප්‍රකාශයන් පැමිණිලිකරු සම්බන්ධයෙන් විශේෂිතවම අපහාසාත්මක වන බවයි. එනම්;

චමුදිත සමරවික්‍රම - ජේනවනේ... දිග අරින්න ඕන තියෙන නීතිය හොඳට නවලා තියෙන හැඩයි ශානි අබේසේකර. ශානි අබේසේකර කරපු දේවල් ඉතින් රංජන් රාමනායකගේ හඬපට ඇතුළෙන්ම දැක්කනේ. පොලිසිය කියන්නේ ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින් රකිනවයි කියලා ධර්ම චක්‍රයත් එක්ක. හැබැයි පොලීසිය, පොලිස් දෙපාර්තමේන්තුව මේ අය කුණු කූඩෙටම දැම්මා. එක්කො පොලිසිය තමන්ගේ ප්‍රමෝෂන් එක, තමන්ගේ එක්ස්ටෙන්ෂන් එක ජනාධිපතිට ඕන විදියට, අගමැතිට ඕන විදියට, ඇමතිවරුන්ට ඕන විදියට කරන්න තියෙන බලු වැඩ ඔක්කොම කරලා පොලිස් දෙපාර්තමේන්තුව කුණු කූඩෙටත් දාලා තමයි යනකොට ගෙදරට යන්න ගියේ. ඒ නිසා අපිට මේ කතාව කිව්වට තේරෙන්නෙ නෑ. කල්පනා කරලා බලන්න නිර්දෝෂී මනුස්සයෙක් අසත්‍ය සාක්ෂි ගොනු කරලා, ෆයිල් හදලා නිරපරාදේ හිරේ දැම්මට පස්සේ ඒ මනුස්සයට ඇතිවෙන දේ අපිට කිව්වට ඒක තේරෙන්නෙ නෑ. අපිට ඒ අත්දැකීම නෑ. ඒ නිසා පොලිසිය, පොලිස් දෙපාර්තමේන්තුවම ශානි අබේසේකරලා අමු අමුවේම දූෂණය කරා. අමු අමුවේම. මිනිස්සුන්ට සාධාරණයක් සඳහා යන්න තියෙන එකම තැන පොලීසිය විතරයි. ඒ තැන පිලිබඳ තියෙන විශ්වාසය තිබුනද දශමයක් හරි තිබුන නම් ඒකත් නැත්තටම නැති කරලා තමයි ශානි අබේසේකරලා යන්න ගියේ. ඒ නිසා මිනිස්සුන්ට රට එපා වෙලා පාස්පෝට් පෝලිමේ ඉන්න එක සාධාරණයි. ඒ නිසා මේ වගේ රටකින් පුළුවන් තරම් ඉක්මනට යන්න ඕන කියන එක මේ මිනිස්සු හිතන එකේ අන්තිම සාධාරණයි. ඒ නිසා ශානිලා කරපු කියපු දේවල් වලින් ඔය අතලොස්සක් විතරයි. අෑ..... රංජන් රාමනායකගේ හඬපට එලියට අවේ නැත්නම් ශානි තාමත් සුදු පිරුවටයක් ඇඳගත්ත මනුෂ්‍යයෙක් විතරයි. එතනින් තමයි පිරුවට ඔක්කොම ගැලවෙන්න පටන්ගත්තෙ. ඒ නිසා මේ හැමදෙයක් පිළිබඳවම එකින් එක අනාවරණය නොවුනොත් එහෙම පොලිස් දෙපාර්තමේන්තුව ගැන තිබුනා නම් අබ මල් රේණුවක හරි පුංචි හරි විශ්වාසයක් ඒකත් ශානිලා ඉවරෙටම ඉවර කරලා දාලා පොලිසියේ දොරත් වහලා තමයි ගෙදර යන්න ගියේ.

විත්තිකරු විසින් සිදු කරන ලද ඉහත කී ප්‍රකාශයෙහි ලිඛිත අනුපිටපතක් (Transcript) ***'පැ 3 '*** *වශයෙන් ලකුණු කර පැමිණිල්ලේම කොටසක් ලෙස අයදිමින් මිට අමුණා ඇත.*

9. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ පැමිණිලිකරු කිසිදු අවස්ථාවක දී ඉහත කී ලක්මන ආරච්චිලාගේ සුගත් කුමාර ලක්මන නම් වූ පුද්ගලයෙක් පිළිබඳව විමර්ශන පවත්වා නොමැති බවත්, පැමිණිලිකරු කිසිම අවස්ථාවකදී මැලේසියාවට ගොස් ලක්මන ආරච්චිලාගේ සුගත් කුමාර ලක්මන නම් කිසිදු පුද්ගලයෙකු මොනයම්ම ආකාරයකින් හෝ අත්අඩංගුවට ගැනීමක් හෝ රඳවා තබා ගැනීමක් හෝ ශ්‍රී ලංකාවට රැගෙන ඒමක් හා/හෝ නඩු පැවරීමට

පැමිණිලිකරු කිසිදු ආකාරයකින් සම්බන්ධ වී හෝ කර නොමැති බවත් කිසිදු අවස්ථාවක ලක්මන ආරච්චිලාගේ සුගත් කුමාර ලක්මන නැමැත්තෙකුට විරුද්ධව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ B/47625/01/06 දරන නඩුකරයක් හෝ වෙනත් කිසිදු ආකාරයේ නඩුකරයක් නොපවරන ලද බවත් ය.

10. **ඉහත කී අපහාසාත්මක ප්‍රකාශනය** 2 වන විත්තිකරු විසින් 2021 ඔක්තෝම්බර් මස 19 වන දින සිය "පත්තරේ විස්තරේ" නම් උදෑසන රූපවාහිනී වැඩසටහන මගින් දිවයින පුරාම වෙසෙන සමස්ත ශ්‍රී ලාංකිකයන් වෙත සජීවීව විකාශය/ප්‍රකාශනය කිරීමට සලස්වා ඇති බවත්, තවද සමාජ මාධ්‍ය පිටුව ඔස්සේ ද දේශීය හා විදේශීය රටවල සිටින ශ්‍රී ලාංකිකයන් අතර නැරඹීමට සලස්වා ඇති බවත්, ඒ අනුව එය "ප්‍රකාශනය" (Publication) යන අර්ථය/නිර්වචනය තුළට ඇතුලත් වන බවත් ය.

11. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ **ඉහත කී අපහාසාත්මක ප්‍රකාශන** මෙම නඩුව ගොනු කරන අවස්ථාව වන විටත් Hiru News You Tube නාලිකාවෙන් සහ Hiru News සමාජ මාධ්‍ය පිටුව ඔස්සේ ද දේශීය හා විදේශීය රටවල සිටින ශ්‍රී ලාංකිකයන් අතර නැරඹීමේ හැකියාව පවතින බවත් ය.

*2021 ඔක්තෝම්බර් මස 19 වන දින, 1 වන විත්තිකරු විසින් "Hiru News" නම් You Tube නාලිකාවේ සහ "Hiru News" නම් Facebook සමාජ මාධ්‍ය පිටුව ඔස්සේ ප්‍රකාශනය කරන ලද ඉහත කී වීඩියෝව පිලිබඳව එකී දත්ත නිරූපණය වන ඡායාරූපයක් **'පැ4(අ)'** සහ **'පැ4(ආ)'** වශයෙන් ලකුණු කර මේ සමග ඉදිරිපත් කරන අතර එකී ලේඛනය මෙම පැමිණිල්ලේම කොටසක් ලෙස අයදිමින් මීට අමුණා ඇත.*

12. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 1 වන විත්තිකරු හා 2 වන විත්තිකරු විසින් **ඉහත කී අපහාසාත්මක ප්‍රකාශනය** පැමිණිලිකරුව සෘජුව ඉලක්ක කරගෙන කර ඇති බවත් සහ/හෝ පැමිණිලිකරු ඉලක්ක කරගෙන කර ඇති බව පැහැදිලිවම තේරුම්ගත හැකි බවත් ය.

13. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ **ඉහත කී ප්‍රකාශනය** සම්පූර්ණයෙන් ව්‍යාජ හා අසත්‍ය කරුණු මත පදනම්ව කර ඇති සම්පූර්ණ අසත්‍යක් (false) සහ/හෝ නිවැරදි නොවන (incorrect) සහ/හෝ මහජනතාව නොමග යවන සුළු ප්‍රකාශනයක් බවත්, එසේ හෙයින් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, 2 වන විත්තිකරු විසින් විකාශය/ප්‍රකාශනය කරන ලද 1 වන විත්තිකරුගේ ඉහත කී අපහාසාත්මක ප්‍රකාශනය ස්වාධීනව සහ/හෝ සිය කැමැත්තෙන්ම සහ/හෝ හිතාමතාම දේශපාලන හේතූන් අරභයා පැමිණිලිකරු කෙරෙහි ද්වේශ සහගත චේතනාවෙන් *(malice)*; සහ/හෝ ප්‍රකාශිත ද්වේශයෙන් (*express malice)*; සහ/හෝ හිංසක චේතනාවෙන් *(animus injuriandi)*; සහ/හෝ අසද්භාවයෙන් කටයුතු කළ *(mala fide)* බවත්;

එමගින් පැමිණිලිකරු ගේ කීර්තිනාමය කෙලෙසීම සහ/හෝ කීර්තිනාමයට හානි කිරීමේ එකම අරමුණින් සහ අපහාස කිරීමේ එකම අරමුණින් එසේ කටයුතු කර ඇති බවත් එමගින් පැමිණිලිකරුව අපහාසයට ලක්කර ඇති බවත් ය.

14. පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ **ඉහත කී අපහාසාත්මක ප්‍රකාශනය** 1 වන විත්තිකරු සහ/හෝ 2 වන විත්තිකරු විසින් සිදුකර ඇත්තේ එහි සත්‍යතාවය පිලිබඳව පැමිණිලිකරු ගෙන් කිසිදු කරුණු විමසීමකින් තොරව බවත්, විශේෂයෙන්ම 2 වන විත්තිකරුගේ වාර්තාකරු එම අවස්ථාවේදී හෝ පසු අවස්ථාවකදී හෝ කිසිදු කරුණු විමසීමකින් තොරව **ඉහත කී අපහාසාත්මක ප්‍රකාශනය** 1 සහ/හෝ 2 විත්තිකරුවන් විකාශය/ප්‍රකාශනය (Broadcast/Publication) කරන ලද බවත්, එමගින් 1 සහ/හෝ 2 විත්තිකරුවන් තුල පැමිණිලිකරු කෙරෙහි පවතින අසද්භාවය (*mala fide*) මනාවට පැහැදිලි වන බවත් ය.

15. පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ,

(අ) පැමිණිලිකරු ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව අධ්‍යක්ෂක ලෙස කටයුතු කරන වකවානුවේ හෝ සිය වෘත්තීය ජීවිතය තුල කිසිදු විටක දේශපාලන අතකොළුවක් බවට පත්ව කටයුතු කර නොමැති බවත්;

(ආ) සියලු රාජකාරී කටයුතු නීතියේ නිසි ක්‍රියා පටිපාටිය සහ ක්‍රියාදාමය තුල සිදු කරනු ලැබූ බවත්;

(ඇ) අත්තනෝමතික ලෙස විමර්ශන කටයුතු මෙහෙයවා හෝ නඩු පැවරීම් සිදු කර නොමැති බවත්;

(ඈ) සියලු අවස්ථාවන්හි දී ම විමර්ශන කටයුතු කිරීම සහ නඩු පැවරීම කරන ලද්දේ නීතිපති උපදෙස් සහ ඉහල නිළධාරීන්ගේ උපදෙස් වලට අනුකූලව බවත්;

(ඉ) විමර්ශනවල දී මතු වන සාක්ෂි වලට අනුකූලව පමණක් සියලු අවස්ථා වලදී නඩු කටයුතු පවරා ඇති බවත්;

(ඊ) සියලු රාජකාරී කටයුතු සිය තනතුර අවභාවිතා කරමින් කිසිදු පුද්ගලයෙකුට එරෙහිව ද්වේශසහගතව නඩු පවරා නොමැති බවත් ය.

16. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 1 වන විත්තිකරු විසින් ප්‍රකාශ කොට 2 වන විත්තිකරු විසින් විකාශය/ප්‍රකාශනය කරන ලද ඉහත කී ප්‍රකාශනය එහි ස්වරූපයෙන්ම (*per se*)

පැමිණිලිකරු කෙරෙහි අපහාසාත්මක බව සහ/හෝ පැමිණිලිකරුව අපහාසයට පත්කිරීමේ ද්වේශසහගත චේතනාවෙන් (*malice*) සිදු කර ඇති බව ය.

17. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඉහත කී ප්‍රකාශනය වක්‍රාකාරයෙන්ද (*innuendo)* පැමිණිලිකරු කෙරෙහි අපහාසාත්මක බවත්, විශේෂයෙන්ම එකී ප්‍රකාශනය මගින් 1 වන සහ 2 වන විත්තිකරුවන් පැමිණිලිකරු කෙරෙහි පහත සඳහන් සාවද්‍ය කරුණු එකක් හෝ වැඩි ගණනක් හෝ සියල්ලම මහජනතාවට ඒත්තු ගන්වන බවත් සහ/හෝ ව්‍යංගයෙන් අදහස් කරන බවත් සහ/හෝ තේරුම් කර දී ඇති බවත් සහ/හෝ අසාධාරණ ලෙස මහජනතාවට එසේ තේරුම් ගැනීමට සලස්වා ඇති බවත් ය. එනම්;

i. පැමිණිලිකරු විසින් ද්වේශ සහගත ලෙස පුද්ගලයින්ට විරුද්ධව නීතියට පටහැනි ආකාරයෙන් නඩු පැවරීමට කටයුතු කර ඇති බවත්;

ii. පැමිණිලිකරු විසින් පුද්ගලයින්ට එරෙහිව ද්වේශ සහගතව නඩු පවරා ඇත්තේ දේශපාලන අධිකාරියේ වුවමනාව මත සහ/හෝ පුද්ගලික ප්‍රතිලාභ බලාපොරොත්තුවෙන් බවත්;

iii. පැමිණිලිකරු වෘත්තිමය අවංකත්වයක් නොමැති (*lacks professional integrity*) තැනැත්තෙක් බවත්;

iv. පැමිණිලිකරු වෘත්තිමය අචාරධර්මවලට ගරු නොකරන (*lacks professional ethics*) තැනැත්තෙක් බවත්;

v. පැමිණිලිකරු වංක සහ/හෝ වෘත්තීය කටයුතු වලදී ආචාරසම්පන්න ලෙස කටයුතු නොකරන තැනැත්තෙක් බවත්;

vi. පැමිණිලිකරු නීතිවිරෝධී හා නීත්‍යානුකූල නොවන ආකාරයේ කටයුතුවල නියැලෙන තැනැත්තෙක් බවත්;

vii. පැමිණිලිකරුට වෘත්තිමය වශයෙන් ලැබී ඇති බලතල හා අධිකාරිත්වය අයුතු ලෙස භාවිතා කරන තැනැත්තෙක් බවත්;

viii. පැමිණිලිකරු සිය වෘත්තිමය රාජකාරී කටයුතු හා ඊට අදාළ වගකීම් ඉටුකිරීමේදී දේශපාලන බලපෑම් වලට නතුව හා ඊට යටත්ව කටයුතු කරන තැනැත්තෙක් බවත්;

ix. පැමිණිලිකරු සිය වෘත්තිමය රාජකාරී කටයුතු හා ඊට අදාළ වගකීම් නිසි පරිදි හා නිවැරදිව ඉටු නොකළ තැනැත්තෙක් බවත්;

වශයෙනි.

18. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඉහත කී ද්වේශසහගත සහ අපහාසාත්මක ප්‍රකාශනය සිදු කිරීම හේතුවෙන් පැමිණිලිකරුගේ ප්‍රසිද්ධිය, කීර්තිනාමය, පුද්ගලික ගෞරවය සහ ප්‍රතිරූපයට දැඩි ලෙස හානි වී සහ/හෝ බලවත් පාඩු සිදු වී ඇති බවත් එමගින් පැමිණිලිකරු අපකීර්තියටත්, අපහාසයටත් සහ අවමානයටත් පත්ව ඇති බවත්, තවද බලවත් මානසික වේදනාවකට හා බලවත් මානසික පීඩාවකට ලක්ව ඇති බවත් ය.

19. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඉහත කී ප්‍රකාශනය මගින් පැමිණිලිකරු මහජනතාව ඉදිරියේ සහ/හෝ සමාජයේ සාධාරණ මිනිසා ඉදිරියේ ගොඩනගාගෙන තිබූ පැමිණිලිකරුගේ ප්‍රතිරූපයට දැඩි ලෙස හානි වී ඇති බවත්, එසේම ඉහත කී ප්‍රකාශනය තුලින් පැමිණිලිකරුව මහජනතාව හා සාධාරණ මිනිසා ඉදිරියේ වෛරයටත් සහ/හෝ සමච්චලයටත් සහ/හෝ අපහාසයටත් සහ/හෝ උපහාසයටත් ලක් කර ඇති බවත් එමගින් පැමිණිලිකරුගේ ප්‍රතිරූපයට සහ/හෝ කීර්තිනාමයට හානිකර ඇති බවත් ය.

20. පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ ඉහත කී ප්‍රකාශනය මගින් පැමිණිලිකරු වසර 35ක් පුරා මහජනතාව ඉදිරියේ අවංක රාජ්‍ය නිලධාරියකු ලෙසත් සිය වෘත්තියේ සමකාලීනයන් හා වෘත්තිකයන් අතර ගොඩනගාගෙන තිබූ කීර්තිනාමයට හානි සහ/හෝ පාඩු සිදු වූ බවත් ය.

21. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ 1 වන විත්තිකරුගේ ඉහත සඳහන් වැරදි සහගත සහ නීතිවිරෝධී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් 2 වන විත්තිකරු ප්‍රතිපුරුෂ වගකීමෙන් ද (Vicariously Liable) බැඳී සිටින බවයි.

22. 1 වන විත්තිකරු විසින් ප්‍රකාශ කරන ලද හා 2 වන විත්තිකරු විසින් විකාශය/ප්‍රකාශනය කරන ලද ඉහත කී වැරදි සහගත සහ/හෝ ද්වේශසහගත ප්‍රකාශය මගින් පැමිණිලිකරුගේ කීර්තිනාමයට සිදුවූ හානිය පැමිණිලිකරු විසින් රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) කට අගය කර සිටියි.

23. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 1 වන සහ/හෝ 2 වන විත්තිකරුවන්ගේ ඉහත සඳහන් නීතිවිරෝධී සහ ද්වේශ සහගත ක්‍රියාකලාපය හේතුවෙන් සිදුවූ හානිය වශයෙන් රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) ක අලාභ මුදලක් ගෙවන ලෙස එන්තරවාසියක් යවන ලද වුව ද 1 වන සහ/හෝ 2 වන විත්තිකරුවන් විසින් එක්ව සහ/හෝ වෙන් වෙන්ව එකී මුදල හෝ ඉන් කොටසක් ගෙවීම පැහැර හැර අතපසු කර ඇති බවයි.

ඒ බව සනාථ කිරීම සඳහා පැමිණිලිකරුගේ ලේඛනගත නීතිඥ විසින් 1 වන සහ 2 වන විත්තිකරුවන් වෙත යවන ලද එන්තරවාසි ලිපි **'පැ5(අ)'** හා **'පැ5(ආ)'** ලෙසද, ඊට අදාළ තැපැල් භාණ්ඩ කුවිතාන්සි **'පැ6(අ)'** හා **'පැ6(ආ)'** ලෙසද ලකුණු කර පැමිණිල්ලේම කොටසක් ලෙස අයදිමින් මිට අමුණා ඇත.

24. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ,

(අ) 2 වන විත්තිකරු විසින් වර්ෂ 2022 මැයි මස 04 වන දාතමින් යුතු ලිපියක් මගින් එකී එන්තරවාසි ලිපියේ අන්තර්ගතයන් වැරදි සහගත ලෙස ප්‍රතික්ෂේප කරමින් පිළිතුරු ලිපියක් යොමු කරන ලද බවත්,

(ආ) 1 වන විත්තිකරු ඉහත කී එන්තරවාසි ලිපිය සඳහා පිළිතුරු සැපයීම පැහැර හැර සහ/හෝ අතපසු කර හෙයින් එකී එන්තරවාසි ලිපියේ අන්තර්ගතය හබ කිරීමෙන් 1 වන විත්තිකරු නීතියෙන් ප්‍රතිබන්ධනය වන බවයි.

25. ඉහත කී කරුණු මත පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ 1 වන සහ 2 වන විත්තිකරුවන්ගෙන් එක්ව සහ/හෝ වෙන්වෙන්ව රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) ක මුදලක් පැමිණිල්ලේ දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තුරු තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික පොලියද සමග මුළු මුදල එක්ව හෝ වෙන් වෙන්ව අය කරගැනීම සඳහා 1 වන සහ/හෝ 2 වන විත්තිකරුවන්ට එරෙහිව පැමිණිලිකරුගේ වාසියට නඩු නිමිත්තක් උපචය වී ඇති බවයි.

26. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ;

(අ) මෙම ගරු අධිකරණය විසින් ඇතුළත් කරනු ලබන නඩු තීන්දුවක හෝ තීන්දු ප්‍රකාශයක ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුගේ වාසියට ලැබෙන විනිශ්චිත ණය මුදල පැමිණිලිකරුට තෘප්ත කර ගැනීම වැළැක්වීම උදෙසා ඉහත කී විත්තිකරුවන් විසින් එකී විත්තිකරුවන්ගේ වත්කම් බැහැර කිරීමට සහ/හෝ අන්සතු කිරීමට සහ/හෝ මොනයම් හෝ උකසට තැබීමට තැත් කරනු ලැබිය හැකි බවට පැමිණිලිකරු තරයේ විශ්වාස කරන බවත්,

(ආ) මෙම නඩුවට අදාළ අපහාසාත්මක ප්‍රකාශය මේ වනවිටත් මෙම පැමිණිල්ලේ වැඩිදුර දක්වා ඇති පරිදි මහජනතාවට නැරඹිය හැකි බවත්,

(ඇ) විත්තිකරුවන්ගේ ක්‍රියාකලාපය සැළකිල්ලට ගැනීමේදී, 1 වන සහ 2 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට එරෙහිව දිගින් දිගටම අපහාස කිරීමේ හැකියාවක් පවතින බව මනාව තහවුරු වන බවත්,

(ඈ) එලෙස ඉහත ප්‍රකාශ අඛණ්ඩව සිදු කිරීම සහ ප්‍රසිද්ධ කිරීම සහ සංසරණය කිරීම හේතුවෙන් පැමිණිලිකරුට අප්‍රතිකාරී පාඩුවක් සහ හානියක් සිදුවෙමින් පවතින බවත්,

(ඉ) එමනිසා 1 වන සහ 2 වන විත්තිකරුවන්ගේ එකී ක්‍රියාකලාපය නිසා පැමිණිලිකරුට සිදුවෙමින් පවතින සහ ඉදිරියේදී සිදුවීමට හැකි අප්‍රතිකාරී සහ අප්‍රතිකර්මිත (gross & irrevocable) අලාභ සහ හානි සිදුවීම වැලැක්වීම සඳහා විත්තිකරුවන්ගේ ද්වේෂ සහගත ක්‍රියාකලාපය වළක්වාලීම සඳහා ගරු අධිකරණයේ සහාය පතන බවත්ය.

27. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ඉහත කී විත්තිකරුවන් ඔවුන්ගේ වත්කම් සාර්ථකව බැහැර කිරීම සහ/හෝ අන්සතු කිරීම සහ/හෝ මොනයම් හෝ උකසට තැබීම කරනු ලැබුවහොත් අවසානයේ දී, පැමිණිලිකරුගේ වාසියට ලබා දෙන නඩු තීන්දුවක්, පරාජයට සමාන ජයග්‍රහණයක් බවට පත් කරමින් නිෂ්ඵල සහ නොවටිනා නඩු තීන්දුවක් වනු ඇති බවත් මෙම අවස්ථානුගත කරුණු අනුව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ ගරු අධිකරණයෙන් මතු සඳහන් අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගය සහ වාරණ නියෝගය ලබා ගැනීම පිණිස පැමිණිලිකරුට නිමිත්තක් උපවය වී ඇති බවත් ය. එනම් ;

(අ) මෙම නඩුකරයේ තීන්දු ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සංතෘප්ත කරන තෙක් ඉහත කී විත්තිකරුවන් සන්තකයේ රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) ක මුදලක් තබා ගැනීමෙන් තොරව එකී විත්තිකරුවන්ගේ වත්කම් හෝ එයින් යම් කොටසක් අන්සතු කිරීමෙන් එකී විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ සේවකයන් සහ/හෝ නියෝජිතයන් සහ/හෝ ඉහත විත්තිකරුවන් යටතේ හිමිකම් ඉදිරිපත් කරන යම් වෙනත් තැනැත්තන් වලක්වමින් **ස්ථිර තහනම් නියෝගයක්** ලබා ගැනීම සඳහාත්;

(ආ) මෙම නඩුකරය අවසන් වශයෙන් විභාග කොට තීරණයක් කරන තුරු ඉහත කී විත්තිකරුවන් සන්තකයේ රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) ක මුදලක් තබා ගැනීමෙන් තොරව එකී විත්තිකරුවන්ගේ වත්කම් හෝ එයින් යම් කොටසක් අන්සතු කිරීමෙන් එකී විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ සේවකයන් සහ/හෝ නියෝජිතයන් සහ/හෝ ඉහත විත්තිකරුවන් යටතේ හිමිකම් ඉදිරිපත් කරන යම් වෙනත් තැනැත්තන් වලක්වමින් **අතුරු තහනම් නියෝගයක්** ලබා ගැනීම සඳහාත්;

(ඇ) අතුරු තහනම් නියෝගයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම විභාග කොට තීරණයක් කරන තුරු ඉහත කී විත්තිකරුවන් සන්තකයේ රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) ක මුදලක් තබා ගැනීමෙන් තොරව එකී විත්තිකරුවන්ගේ වත්කම් හෝ එයින් යම් කොටසක් අන්සතු කිරීමෙන් එකී විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ සේවකයන් සහ/හෝ නියෝජිතයන් සහ/හෝ ඉහත විත්තිකරුවන් යටතේ හිමිකම් ඉදිරිපත් කරන යම් වෙනත් තැනැත්තන් වළක්වමින් **වාරණ නියෝගයක්** ලබා ගැනීම සඳහාත්;

(ඈ) මෙම නඩුකරයේ තීන්දු ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සංතෘප්ත කරන තෙක්, ඉහත කී විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පාන සියලුම තැනැත්තන් විසින් පැමිණිලිකරුට අප්‍රසිද්ධිය ගෙනදෙන ප්‍රකාශයන් සිදු කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ ප්‍රසිද්ධියට පත්කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ සංසරණය කිරීම වළක්වාලමින් **ස්ථිර තහනම් නියෝගයක්** ලබාගැනීම සඳහාත්;

(ඉ) මෙම නඩුකරය අවසන් වශයෙන් විභාග කොට තීරණයක් කරන තෙක්, ඉහත කී විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පාන සියලුම තැනැත්තන් විසින් පැමිණිලිකරුට අප්‍රසිද්ධිය ගෙනදෙන ප්‍රකාශයන් සිදු කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ ප්‍රසිද්ධියට පත්කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ සංසරණය කිරීම වළක්වාලමින් **අතුරු තහනම් නියෝගයක්** ලබාගැනීම සඳහාත්;

(ඊ) අතුරු තහනම් නියෝගයක් ලබාගැනීම සඳහා වන ඉල්ලීම විභාග කොට තීරණයක් කරන තෙක්, ඉහත කී විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පාන සියලුම තැනැත්තන් විසින් පැමිණිලිකරුට අප්‍රසිද්ධිය ගෙනදෙන ප්‍රකාශයන් සිදු කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ ප්‍රසිද්ධියට පත්කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ සංසරණය කිරීම වළක්වාලමින් **වාරණ නියෝගයක්** ලබාගැනීම සඳහාත් ය.

28. තවද, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති අතුරු සහනයන් පැමිණිලිකරුගේ වාසියට ලබා නොදුනහොත්, පැමිණිලිකරුට දැරිය නොහැකි අලාභ සහ පාඩු විදීමට සිදුවන බවයි.

29. මෙම නඩුව මුද්දර ගාස්තු කාර්යය සඳහා රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) කට අගය කර සිටියි.

30. මෙම පැමිණිල්ලේ දක්වා ඇති සම්ප්‍රකාශ තහවුරු කිරීම පිණිස පැමිණිලිකරු විසින් පැමිණිලිකරුගේ දිවුරුම් ප්‍රකාශය මීට අමුණා ඉදිරිපත් කර සිටියි.

**කරුණු එසේ හෙයින් පැමිණිලිකරු ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ ඉහත 1 වන සහ/හෝ 2 වන විත්තිකරුවන්ට එරෙහිව එක්ව සහ/හෝ වෙන් වෙන්ව,**

(අ) පැමිණිලිකරුගේ වාසියට 1 වන සහ/හෝ 2 වන විත්තිකරුවන්ගෙන් රුපියල් මිලියන පන්සීයක් (රු.500,0000,000/-) ක මුදලක් සහ පැමිණිල්ලේ දින සිට නඩු තීන්දුවේ සඳහන් දින තෙක් නෛතික පොලියක් ලබා ගැනීටත් ඉන් අනතුරුව එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තුරු තීන්දු ප්‍රකාශිත මුදල මත අමතර නෛතික පොලියද සමග මුළු මුදල අය කර ගැනීම සඳහා නඩු තීන්දුවක් හා තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීම සඳහාත් ;

(ආ) මෙම නඩුකරයේ තීන්දු ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සංතෘප්ත කරන තෙක් ඉහත කී විත්තිකරුවන් සන්තකයේ රුපියල් මිලියන පන්සියය (රු.500,000,000/-) ක මුදලක් තබා ගැනීමෙන් තොරව එකී විත්තිකරුවන්ගේ වත්කම් හෝ එයින් යම් කොටසක් අන්සතු කිරීමෙන් එකී විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ සේවකයන් සහ/හෝ නියෝජිතයන් සහ/හෝ ඉහත විත්තිකරුවන් යටතේ හිමිකම් ඉදිරිපත් කරන යම් වෙනත් තැනැත්තන් වලක්වමින් **ස්ථිර තහනම් නියෝගයක්** ලබා ගැනීම සඳහාත් ;

(ඇ) මෙම නඩුකරයේ තීන්දු ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සංතෘප්ත කරන තෙක්, ඉහත කී විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පාන සියලුම තැනැත්තන් විසින් පැමිණිලිකරුට අප්‍රසිද්ධිය ගෙනදෙන ප්‍රකාශයන් සිදු කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ ප්‍රසිද්ධියට පත්කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ සංසරණය කිරීම වළක්වාලමින් **ස්ථිර තහනම් නියෝගයක්** ලබාගැනීම සඳහාත්;

(ඈ) මෙම නඩුකරය අවසන් වශයෙන් විභාග කොට තීරණයක් කරන තුරු ඉහත කී විත්තිකරුවන් සන්තකයේ රුපියල් මිලියන පන්සියයක (රුපි. 500,000,000/-) ක මුදලක් තබා ගැනීමෙන් තොරව එකී විත්තිකරුවන්ගේ වත්කම් හෝ එයින් යම් කොටසක් අන්සතු කිරීමෙන් එකී විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ සේවකයන් සහ/හෝ නියෝජිතයන් සහ/හෝ ඉහත විත්තිකරුවන් යටතේ හිමිකම් ඉදිරිපත් කරන යම් වෙනත් තැනැත්තන් සහ/හෝ යැපෙන්නන් සියලු දෙනාම වලක්වමින් **අතුරු තහනම් නියෝගයක්** ලබා ගැනීම සඳහාත් ;

(ඉ) මෙම නඩුකරය අවසන් වශයෙන් විභාග කොට තීරණයක් කරන තෙක්, ඉහත කී විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පාන සියලුම තැනැත්තන් විසින් පැමිණිලිකරුට අප්‍රසිද්ධිය ගෙනදෙන ප්‍රකාශයන් සිදු කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ

ප්‍රසිද්ධියට පත්කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ සංසරණය කිරීම වළක්වාලමින් **අතුරු තහනම් නියෝගයක්** ලබාගැනීම සඳහාත්;

(ඊ) ඉහත (ඈ) ඡේදයේ ඉල්ලා ඇති අතුරු තහනම් නියෝගය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම විභාග කොට තීරණයක් කරන තුරු ඉහත කී විත්තිකරුවන් සන්තකයේ රුපියල් මිලියන පන්සියයක (රුපි. 500,000,000/-) ක මුදලක් තබා ගැනීමෙන් තොරව එකී විත්තිකරුවන්ගේ වත්කම් හෝ එයින් යම් කොටසක් අන්සතු කිරීමෙන් එකී විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ සේවකයන් සහ/හෝ නියෝජිතයන් සහ/හෝ ඉහත විත්තිකරුවන් යටතේ හිමිකම් ඉදිරිපත් කරන යම් වෙනත් තැනැත්තන් වළක්වමින් **වාරණ නියෝගයක්** ලබා ගැනීම සඳහාත් ;

(උ) ඉහත (ඉ) ඡේදයේ ඉල්ලා ඇති අතුරු තහනම් නියෝගය ලබාගැනීම සඳහා වන ඉල්ලීම විභාග කොට තීරණයක් කරන තෙක්, ඉහත කී විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පාන සියලුම තැනැත්තන් විසින් පැමිණිලිකරුට අප්‍රසිද්ධිය ගෙනදෙන ප්‍රකාශයන් සිදු කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ ප්‍රසිද්ධියට පත්කිරීම සහ/හෝ එවන් ප්‍රකාශ සංසරණය කිරීම වළක්වාලමින් **වාරණ නියෝගයක්** ලබාගැනීම සඳහාත් ය.

(ඌ) අතුරු තහනමේ දැන්වීම නිකුත් කරගැනීම සඳහාත් ;

(එ) නඩු ගාස්තු, සහ

(ඒ) මෙකී කාරණයෙහිලා ගරු අධිකරණයට මැනවැයි හැඟෙන වෙනත් හා වැඩිමනත් සහන ලබා ගැනීම සඳහාත් ය.

පැමිණිලිකරුගේ නීතිඥ

පැමිණිල්ලේම කොටසක් ලෙස අයැද පැමිණිල්ලට අමුණා ඇති ඇමුණුම් :

1. **'පැ1'** - අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තිමය පළපුරුද්ද පිළිබඳ ලුහුඩු විස්තරයක සත්‍ය පිටපත
2. **'පැ2'** - ප්‍රකාශය ඇතුලත් DVD තැටිය
3. **'පැ2(අ)'**- සම්පූර්ණ ප්‍රකාශයන්හි ලිඛිත අනු පිටපත
4. **'පැ3'** - විත්තිකරුගේ ප්‍රකාශයෙහි ලිඛිත අනුපිටපතක්
5. **'පැ4(අ)'** - Hiru News You Tube නාලිකාවේ දත්ත නිරූපණය වන ඡායාරූපය
6. **'පැ4(ආ)'** - Hiru News Facebook සමාජ මාධ්‍ය පිටුවේ දත්ත නිරූපණය වන ඡායාරූපය
7. **'පැ5(අ)'** - එන්තරවාසි ලිපිය
8. **'පැ5(ආ)'** - එන්තරවාසි ලිපිය
9. **'පැ6(අ)'** - තැපැල් භාණ්ඩ කුවිතාන්සිය
10. **'පැ6(ආ)'** - තැපැල් භාණ්ඩ කුවිතාන්සිය

පැමිණිලිකරුගේ නීතිඥ

සකස් කළේ :-

සිතාරි පෙරේරා
ඩිලාන් නාලක
දුල්නා ද අල්විස්
නිෂාදි වික්‍රමසිංහ
තිෂ්‍ය වේරගොඩ
දිලුමිද අල්විස්
නීතිඥවරු

ඩිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ
ජනාධිපති නීතිඥ

**පැ2(අ) ඇමුණුම**

චමුදිත සමරවික්‍රම - ශානි ඇතුළු තිදෙනෙකුට එරෙහි නඩුව කැඳවයි, මේ ගම්පහ ටෝනි කරුණානායකගේ වාර්තාව. අසත්‍ය සාක්ෂි නිර්මාණය කර අධිකරණය නොමග හැරීම ඇතුළු තවත් චෝදනා සම්බන්ධයෙන් ඇප මත සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේතුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර ඇතුළු සැකකරුවන් තිදෙනාට විරුද්ධව ඇති නඩුව ඊයේ ගම්පහ ප්‍රධාන මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා හමුවේ කැඳවුනා. ඒ කැඳවූ අවස්ථාවෙන් පසුව ඇතිවූ තත්වය දෙස දැන් අවධානය යොමු කරමු.

නිවේදකයකු - අසත්‍ය සාක්ෂි නිර්මාණය කර අධිකරණය නොමග හැරීම ඇතුළු චෝදනා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකරට එරෙහිව ගොනු කර ඇති නඩුව කැඳවුයේ ගම්පහ ප්‍රධාන මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා ඉදිරියේයි. මේ වන විට ඇප මත මුදාහැර සිටින ශනි අබේසේකර නඩු කටයුතු අවසන් වීමෙන් පසු පිටතට පැමිණි අවස්ථාවේදී අධිකරණ සංකීර්ණය ඉදිරිපිට සිටි පුද්ගලයකුගෙන් ඔහුට දැඩි විරෝධයක් එල්ල වුනා.

සුගත් කුමාර ලක්මන - " ඔබතුමාට මාව මතක නැතුව ඇති නේද? මම තමයි මැලේසියාවේ හිටපු සුගත් ලක්මන , ඔයා මාව රට ඉන්දැද්දී ගෙනල්ලා ඉවරවෙලා රජයේ මුදල් අවභාවිතා කරලා තමයි මාව ගෙනාවේ. එතකොට ගෙනල්ලත් මට ඉඳන් කිව්වෙ මොකද්ද මාව දවස් දාහතරක් රිමාන්ඩ් කරගෙන හිටියා. එතකොට මාව ගෙනල්ලා ඉඳන් කිව්වා මහින්ද මහත්තයට විරුද්ධව කතා කරන්න කියලා, මෙහෙමයි කියලා. මේ තියෙන්නෙ මාව උසාවියෙන් නිදොස්කොට නිදහස් කරද්දීත්, මෙයා වීරගුල පොලීසියට මැසේජ් එකක් ගැහුවා මාව ත්‍රස්ත විමර්ශන අංශයට ගේන්න කියලා. එහෙව් තියෙද්දී අද මම නිදහසේ ඉන්නවා, හැබැයි අද ඔබතුමා උසාවි ගානෙ රිංගනවා. ඕක තමයි මහත්තයෝ කියන්නේ දිට්ඨධම්මවේදනීය කර්මය කියලා, තේරුනාද? ඔබතුමා අද ඔහොම එළියේ නෙවෙයි ඉන්න ඕන, ඔබතුමා අද ඉන්න ඕන, එල්ලුම්ගස් යන්න ඕන. අන්න මාව සී.අයි.ඩි ඒකට ගෙනාපු වෙලාවෙත් මට ඉඳන් කිව්ව රාජපක්ෂලාට කඩේ යනවයි කියලා. නමුත් අද මම එළියේ ඉන්නවා. මාව නිදොස්කොට නිදහස් කරල තියෙද්දී තමයි මේවා ඔක්කොම කරේ. මේ තියෙන්නේ මේ.... උසාවියෙන් නිදොස්කොට නිදහස් කරලා. මේ සියලුම ඩොකිව්මන්ට්ස් මං ගාව තියෙනවා. ජරා විදියට හැසිරෙන්න එපා. නඩුකාර හාමුදුරුවන්ට කතා කර කර, නඩුකාරවරුන්ට කතා කර කර, දැන් අද කොහොමද තත්වෙ. මට කියන්න එච්චරයි දැන් ඉතින් කටත් පුකත් වහගෙන යනව."

සුගත් කුමාර ලක්මන - යහපාලන ආණ්ඩු රජය තිබ්බ්ච වෙලාවෙදි මම ජාතික ගීය දෙමළෙන් ගායනා කරනවට විරුද්ධ උනා. ගෝල්ෆේස් පිටියේ තිබ්බේ මේ නිදහස් උත්සවේ දවසෙ. එතකොට මං ඒකට මගේ හිතේ වේදනාවට යම්කිසි ප්‍රකාශයක් කරා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි, රනිල් වික්‍රමසිංහටයි මම දොස් කිව්වා.

වාර්තාකරුවෙකු - කොහේදිද කිව්වෙ ඕක.

සුගත් කුමාර ලක්මන - මම කිව්වෙ මැලෙසියාවේදී. මං මගේ ෆෙස්බුක් එකේ විතරයි මං අප්ලෝඩ් කරේ. විරුද්ධ උනාට පස්සේ මෙයාල මට අධිචෝදනාපත්‍රයක් භාර කරා ජනාධිපතිව මරන්න තර්ජනය කරා. ජනාධිපතිව බලයෙන් පහ කරන්න කියලා. ඊටපස්සේ මෙයාල මට මොකද කරේ. රජයේ මුදල් අවභාවිතා කරල පිටරට ගියා. මැලේෂියාවේ දවස් හතක් එයාල ඉඳලා ඉවරවෙලා එයාල ගන්න ෆන් අනංමනං ඔක්කොම අරගෙන මාව එහෙදි අත්අඩංගුවට අරගෙන. මෙයාල මාව ගෙනාවේ හොර පාස්පෝට් එකකින්. මගේ ෆෙස්බුක් එකේ තියෙන ෆොටෝ එකක් අරගෙන ෆොටෝ එක පාස්පෝට් එකට තියල තමා මෙයාල මාව හොර පාස්පෝට් එකෙන් අරං අවේ. මං දන්නෑ මොන හේතුවකට එහෙම ගෙනාවද කියල. එක්කො මාව මරන්න ගෙනාවද කියල මම දන්නේ නෑ. එතකොට මම ඒවා ඔක්කොම මෙයාලට අමතක වෙලා තමා මට ඒවා ඔක්කොම රිලීස් කරේ. අහපු එකම දෙය තමයි රාජපක්ෂලට කඩේ යනව නේද? මාව එතනින් අල්ලාගෙන ඇවිල්ල දවල් 12ට විතර මට මාව කටුනායකට ගෙනාවේ. ගෙනල්ල ඉවරවෙලා කෙලින්ම සී.අයි.ඩී එකට අරං ගියාට පස්සෙ තමයි රාජපක්ෂ මේවා කරන්න කිව්වෙ, අරව කරන්න කිව්වේ කියලා මට චෝදනා කරනවා. මෙයා කියන්නේ එහෙම කියන්න. එතකොට නිදොස්කොට නිදහස් කරනවා. ඊටපස්සේ මෙහෙ ඇවිල්ලා දවස් 14ක් රිමාන්ඩ් කරා. මට ඊටපස්සේ අධිචෝදනාපත්‍ර භාරකරා. හැබැයි මේ කිසිම කෙනෙක් පැමිණිල්ලක් දාල නෑ. දැන් මං කාටහරි ගහනවනන් හරි මොනව කරනවනං දැන් එයා පැමිණිල්ලක් දාන්න ඕනනේ. ඊටපස්සේ විනිශ්චයකාරතුමා ඇහුව කවුද මේකෙ පැමිණිල්ල... පැමිණිල්ලක් නැහැ ස්වාමිනි කියල කිව්ව. යහපාලන ආණ්ඩුවෙන් තමයි මේ පැමිණිල්ල දාන්න කියල තියෙන්නෙ. එතකොට ඒකත් හරි කියන්නකෝ... දැන් මාව නිදොස්කොට නිදහස් කරා මේකෙන්. මෙයාගෙ තියෙන බලතල කියන්නෙ නඩුකාරවරයෙක් දුන්න තීන්දුවට අභිබවා යනව ශානි අබේසේකර. එතකොට කොහොම තත්වයක්ද?

චමුදිත සමරවික්‍රම - පේනවනේ... දිග අරින්න ඕන තියෙන නීතිය හොඳට නවලා තියෙන හැඩයි ශානි අබේසේකර. ශානි අබේසේකර කරපු දේවල් ඉතින් රංජන් රාමනායකගේ හඬපට ඇතුළෙන්ම දැක්කනේ. පොලිසිය කියන්නේ ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින් රකිනවයි කියලා ධර්ම චක්‍රයත් එක්ක. හැබැයි පොලීසිය, පොලිස් දෙපාර්තමේන්තුව මේ අය කුණු කූඩෙටම දැම්මා. එක්කො පොලිසිය තමන්ගේ ප්‍රමෝෂන් එක, තමන්ගේ එක්ස්ටෙන්ෂන් එක ජනාධිපතිට ඕන විදියට, අගමැතිට ඕන විදියට, ඇමතිවරුන්ට ඕන විදියට කරන්න තියෙන බලූ වැඩ ඔක්කොම කරලා පොලිස් දෙපාර්තමේන්තුව කුණු කූඩෙටත් දාලා තමයි යනකොට ගෙදරට යන්න ගියේ. ඒ නිසා අපිට මේ කතාව කිව්වට තේරෙන්නෙ නෑ. කල්පනා කරලා බලන්න නිර්දෝෂී මනුස්සයෙක් අසත්‍ය සාක්ෂි ගොනු කරලා, ෆයිල් හදලා නිරපරාදේ හිරේ දැම්මට පස්සේ ඒ මනුස්සයට ඇතිවෙන දේ අපිට කිව්වට ඒක තේරෙන්නෙ නෑ. අපිට ඒ අත්දැකීම නෑ. ඒ නිසා පොලිසිය, පොලිස් දෙපාර්තමේන්තුවම ශානි අබේසේකරලා අමු අමුවේම දූෂණය කරා. අමු අමුවේම. මිනිස්සුන්ට සාධාරණයක් සඳහා යන්න තියෙන එකම තැන පොලිසිය විතරයි. ඒ තැන පිලිබඳ තියෙන විශ්වාසය තිබුනද දශමයක් හරි තිබුන නම් ඒකත් නැත්තටම නැති කරලා තමයි ශානි

අබේසේකරලා යන්න ගියේ. ඒ නිසා මිනිස්සුන්ට රට එපා වෙලා පාස්පෝට් පෝලිමේ ඉන්න එක සාධාරණයි. ඒ නිසා මේ වගේ රටකින් පුළුවන් තරම් ඉක්මනට යන්න ඕන කියන එක මේ මිනිස්සු හිතන එකේ අන්තිම සාධාරණයි.  ඒ නිසා ශානිලා කරපු කියපු දේවල් වලින් ඔය අතලොස්සක් විතරයි. අෑ..... රංජන් රාමනායකගේ හඬපට එලියට අවේ නැත්නම් ශානි තාමත් සුදු පිරුවටයක් ඇඳගත්ත මනුෂ්‍යයෙක් විතරයි. එතනින් තමයි පිරුවට ඔක්කොම ගැලවෙන්න පටන්ගත්තෙ. ඒ නිසා මේ හැමදෙයක් පිළිබඳවම එකින් එක අනාවරණය නොවුනොත් එහෙම පොලිස් දෙපාර්තමේන්තුව ගැන තිබුනා නම් අබ මල් රේණුවක හරි පුංචි හරි විශ්වාසයක් ඒකත් ශානිලා ඉවරෙටම ඉවර කරලා දාලා පොලිසියේ දොරත් වහලා තමයි ගෙදර යන්න ගියේ.

**පැ3 ඇමුණුම**

චමුදිත සමරවික්‍රම - ජේනවනේ... දිග අරින්න ඕන තියෙන නීතිය හොඳට නවලා තියෙන හැඩයි ශානි අබේසේකර. ශානි අබේසේකර කරපු දේවල් ඉතින් රංජන් රාමනායකගේ හඬපට ඇතුළෙන්ම දැක්කනේ. පොලිසිය කියන්නේ ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින් රකිනවයි කියලා ධර්ම චක්‍රයත් එක්ක. හැබැයි පොලීසිය, පොලිස් දෙපාර්තමේන්තුව මේ අය කුණු කූඩෙටම දැම්මා. එක්කො පොලිසිය තමන්ගේ ප්‍රමෝෂන් එක, තමන්ගේ එක්ස්ටෙන්ෂන් එක ජනාධිපතිට ඕන විදියට, අගමැතිට ඕන විදියට, ඇමතිවරුන්ට ඕන විදියට කරන්න තියෙන බලු වැඩ ඔක්කොම කරලා පොලිස් දෙපාර්තමේන්තුව කුණු කූඩෙටත් දාලා තමයි යනකොට ගෙදරට යන්න ගියේ. ඒ නිසා අපිට මේ කතාව කිව්වට තේරෙන්නෙ නෑ. කල්පනා කරලා බලන්න නිර්දෝෂී මනුස්සයෙක් අසත්‍ය සාක්ෂි ගොනු කරලා, ෆයිල් හදලා නිරපරාදේ හිරේ දැම්මට පස්සේ ඒ මනුස්සයට ඇතිවෙන දේ අපිට කිව්වට ඒක තේරෙන්නෙ නෑ. අපිට ඒ අත්දැකීම නෑ. ඒ නිසා පොලිසිය, පොලිස් දෙපාර්තමේන්තුවම ශානි අබේසේකරලා අමු අමුවේම දූෂණය කරා. අමු අමුවේම. මිනිස්සුන්ට සාධාරණයක් සඳහා යන්න තියෙන එකම තැන පොලීසිය විතරයි. ඒ තැන පිලිබඳ තියෙන විශ්වාසය තිබුනද දශමයක් හරි තිබුන නම් ඒකත් නැත්තටම නැති කරලා තමයි ශානි අබේසේකරලා යන්න ගියේ. ඒ නිසා මිනිස්සුන්ට රට එපා වෙලා පාස්පෝට් පෝලිමේ ඉන්න එක සාධාරණයි. ඒ නිසා මේ වගේ රටකින් පුළුවන් තරම් ඉක්මනට යන්න ඕන කියන එක මේ මිනිස්සු හිතන එකේ අන්තිම සාධාරණයි. ඒ නිසා ශානිලා කරපු කියපු දේවල් වලින් ඔය අතලොස්සක් විතරයි. අෑ..... රංජන් රාමනායකගේ හඬපට එලියට අවේ නැත්නම් ශානි තාමත් සුදු පිරුවටයක් ඇඳගත්ත මනුෂ්‍යයෙක් විතරයි. එතනින් තමයි පිරුවට ඔක්කොම ගැලවෙන්න පටන්ගත්තෙ. ඒ නිසා මේ හැමදෙයක් පිළිබඳවම එකින් එක අනාවරණය නොවුනොත් එහෙම පොලිස් දෙපාර්තමේන්තුව ගැන තිබුනා නම් අබ මල් රේණුවක හරි පුංචි හරි විශ්වාසයක් ඒකත් ශානිලා ඉවරෙටම ඉවර කරලා දාලා පොලිසියේ දොරත් වහලා තමයි ගෙදර යන්න ගියේ.